# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 74 — 1973 අගෝස්තු 24 වැනි සිකුරාද — 1973.08.24**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 825 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | 839 |
| තනතුරු–ඇබෑර්තු ... ... ... | 829 | අය–වැය ලේඛන ... ... ... | 844 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... .. ... | 832 | දේපල විකිණීම ... ... ... | 845 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 832 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥපනත යටතේ දැන්වීම ... | — | විවිධ දැන්වීම ... ... ... | 846 |


**සැලකිය යුතුයි.**—විනිමය පාලන (සංශෝධන) පනත් කෙටුම්පත 1973 අගෝස්තු 17 වන දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදි.

## පළාත් පාලන නිවේදන

### චුන්නාකම් සුළු නගර සභාව

### ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනත

(176 වැනි අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීම් ආඥපනතේ 3 වැනි වගන්තියෙන් රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් සාදනු ලැබූ රීතිය.

f පී ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන පළාත් පාලන හා
ස්වදේශීය කටයුතු අමාත්‍ය.

1973.8.9. වැනි දින,
කොළඹ දිය.

### රීතිය

(176 වන අධිකාරය වන) ප්‍රසිද්ධ රඟ දැක්වීමේ ආඥපනතේ 3 වන වගන්තිය යටතේ සාදන ලද්දවූද 1972 ඔක්තෝබර් 27 වැනි දින අංක 31 දරන ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ රීතියෙන් අන්තිමට සංශෝධනය කරනු ලද්ද වූද 1919 අප්‍රේල් 4 වැනි දින අංක 7,004 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබූ රීති එහි 3අ වැනි රීතියෙහි දක්වා ඇති ගාස්තු ප්‍රමාණයන් වෙනුවට පහත සඳහන් නව ගාස්තු ප්‍රමාණයන් ආදේශකිරීමෙන් චුන්නාකම් සුළු නගර සභාවේ පරිපාලන සීමාවට ඇතුළත් වන ප්‍රදේශයට අදාළ වනතාක් දුරට තවදුරටත් මෙයින් සංශෝධනය කරනුලැබේ:—

| | එක් දිනකට දිනකට | | එක් මසකට | | දෙසැම්බර් 31 වනදයින් අවසන් වන එක් එක් වර්ෂයකට | |
|---|---|---|---|---|---|---|
| | රු. | ශ. | රු. | ශ. | රු. | ශ. |
| ආසන පහසුකම සපයන ලබන පුද්ගලයින් ගේ ගණන 199 ට වැඩි නොවන විට | 10 | 0... | 100 | 0... | 500 | 0 |
| ආසන පහසුකම් සපයනු ලබන පුද්ගලයින්ගේ ගණන 199 ට වැඩි නමුත් 399 ට වැඩි නොවන විට ... | 15 | 0... | 150 | 0... | 750 | 0 |
| ආසන පහසුකම් සපයනු ලබන පුද්ලයින්ගේ ගණන 399 ට වැඩි වන විට... | 20 | 0... | 200 | 0... | 1000 | 0 |

8–926—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

## විශෙෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දැක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශෙෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ. කුමන හේතුවක් නිසාවත් ප්‍රමාද වී ලැබෙන දැන්වීම් භාරගනු නොලැබේ.

1971 මාර්තු මස 19 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## කෑගල්ල නගර සභාව

### තානායම් පනත

කෑගල්ල තානායම පිළිබඳ නිසි බලධාරියා වූ කෑගල්ල නගරයේ විශේෂ කොමසාරිස් විසින් (275 වන අධිකාරය වූ) තානායම් පනතේ 4 වන වගන්තිය යටතේ කෑගල්ල තානායම සම්බන්ධයෙන් පනවන ලදුව, එකී වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද, රීතිය.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973.08.10 වැනි දින,
කොළඹ දී ය.

### රීතිය

කෑගල්ල තානායම සම්බන්ධයෙන් කෑගල්ල නගර සභාව විසින් සම්පාදිතව 1956 මාර්තු 2 වැනි දින අංක 10,899 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූද, 1972 සැප්තැම්බර් 29 දින අංක 27 දරණ ගැසට් පත්‍රයේ පල කරන ලද, රීතිය මගින් අවසන් වරට සංශෝධනය කරන ලද්දාවූද, රීති පහත සඳහන් පරිදි මෙයින් තව දුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි වූ උපලේඛණය වෙනුවට මෙහි දැක්වෙන උපලේඛණය ආදේශ කිරීමෙන් :—

#### උපලේඛණය

#### නතරව සිටීම

රු. ශ.

(1) තානායමේ (නිදන කාමරයක් නොවන) යම් කොටසක නැවතී සිටින තැනැත්තකු වෙනුවෙන් සෑම පැයකට හෝ ඉන් කොටසකට ... 0 25

තානායම් භාරකරු විසින් පිළියෙල කරන ලද, ආහාර වේලක් නොවන වෙනත් ආහාර වේලක් තානායමේ තබාගෙන අනුභව කරන එක් එක් තැනැත්තා විසින් ශත පනහක අතිරේක ගාස්තුවක් ගෙවිය යුතුය. ඉන් ශත 25ක් තානායම් භාරකරු ලබා ගන්නා අතර, ඉතිරි ශත 25 විශේෂ කොමසාරිස්වරයාට ගෙවිය යුතුය.

(2) තානායමේ නිදන කාමරයක් පාවිච්චි කරන එක් එක් තැනැත්තා වෙනුවෙන් :—

(අ) යම් දිනක පෙරවරු 6.00 සිට පස්වරු 6.00 දක්වා යම් කාල සීමාවකට ... ... 3 0

(ආ) යම් දිනක පස්වරු 6.00 සිට පසුවදා පෙරවරු 6.00 වන තුරු යම් කාල සීමාවකට ... 3 50

(ඇ) පැය 12 කට වැඩි වන එහෙත් පැය 24 කට වැඩි නොවන යම් කාල සීමාවකට ... 6 0

(ඇඳක්, සෝපාවක් හෝ කව්ච්චියක් පාවිච්චි කිරීමක්, ඇඳ ඇතිරිලි මේස ඇතිරිලි, තුවා සහ විදුලි එළිය පාවිච්චි කිරීමක් මේ මුදලට අයත් වේ.)

#### මෝටර් රථ හා වෙනත් රථ වාහන

රු. ශ.

(1) රථ වාහනය තබන තැනැත්තා තානායමේ නතරවී සිටින අවස්ථාවක, ගරාජයක තබන සෑම මෝටර් කාරයක්, මෝටර් සයිකලයක් හෝ වෙනත් රථ වාහනයක් සඳහා :—

(අ) පැය එකකට වැඩි නොවන කාල සීමාවක් සඳහා ගාස්තුවක් නැත. ..

(ආ) පැය එකකට වැඩි එහෙත් පැය 6 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 0 25

(ඇ) පැය 6 කට එහෙත් පැය 12 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 50

(ඈ) පැය 12 කට වැඩි එහෙත් පැය 24 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 1 0

(2) රථය තබන තැනැත්තා තානායමේ නතර නොවී සිටින අවස්ථාවක, ගරාජයේ තබන සෑම මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක් හෝ වෙනත් රථ වාහනයක් සඳහා :—

(අ) පැය 1 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... 1 0

(ආ) පැය එකකට වැඩි එහෙත් පැය 6 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 1 25

(ඇ) පැය 6 කට වැඩි එහෙත් පැය 12 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 1 50

(ඈ) පැය 12 කට වැඩි එහෙත් පැය 24 කට අඩු කාල සීමාවක් සඳහා ... ... 2 0

(3) ගරාජයේ ඉඩ තිබියදී රාත්‍රි 8 සිට පසුවදා පෙරවරු 6 දක්වා තානායම් භූමියේ තබන සෑම මෝටර් රථයක්, මෝටර් බයිසිකලයක් හෝ වෙනත් රථ වාහනයක් සඳහා :—

(අ) පැය 2 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ගාස්තුවක් නැත.

(ආ) පැය 2 කට වැඩි එහෙත් පැය 6 කට වැඩි නොවන කාල සීමාවක් සඳහා ... ... 0 25

(ඇ) පැය 6 කට වැඩි යම් කාල සීමාවක් සඳහා ... 0 50

#### රාත්‍රි සේවාව

රාත්‍රි 11 සිට පසුවදා පෙරවරු 6 දක්වා කාලය අතර, සංග්‍රහ කරනු ලබන එක් එක් තැනැත්තකු හෝ කණ්ඩායමක් සඳහා ... ... 2 0

" එසේම තව දුරටත් මෙහි වූ උපලේඛණයෙහි නිශ්චිතව සඳහන් ගාස්තු ප්‍රමාණ වලින් තුනෙන් එකක් තානායම හෝ එහි යම් යම් කොටසක් පරිහරණය කිරීම සඳහා සභාවේ නිලධරයන්ගෙන් අය කරනු ලැබිය යුතුය. මෙම අනුග්‍රහය එවැනි සෑම නිලධරයෙකුගේම පවුලේ සාමාජිකයන්ට ද, අදාල විය යුතුය."

8-1087 —73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## කබිල්ලෙවෙල ගම් සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ බදුල්ල දිස්ත්‍රික්කයේ කබිල්ලෙවෙල ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ගනු ලැබූ පහත දැක්වෙන යෝජනාව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනු ලැබ, ඒ වගන්තියේ (2) වැනි උපවගන්තිය අනුව පළ කරනු ලැබේ.

### යෝජනාව

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මේ සභාව විසින්, සභාවේ පාලන සීමාව ඇතුලත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (තත් ආඥාපනතේ විස්තර කර ඇති) විනෝද කටයුතු සඳහා ඇතුළුවීම පිණිස අය කරනු ලබන ගෙවීම් වලින් මෙහි පහත දැක්වෙන ප්‍රමාණ අනුව, බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළකරනු ලබන දින සිට මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල | බදු ප්‍රමාණය |
|---|---|
| බදු මුදල හැර ඇතුළුවීම සඳහා ගෙවන මුදල | රු. ශත |
| (අ) ශත 20 ට අඩු නොවන නමුත් ශත 50 ට වැඩි නොවන විට ... ... | 0 05 |
| (ආ) ශත 50 ට වැඩි වන නමුත් රු. 1.00 ට වැඩි නොවන විට ... ... | 0 10 |
| (ඇ) රු. 1.00 ට වැඩි වන නමුත් රු. 1.50 ට වැඩි නොවන විට ... ... | 0 15 |
| (ඈ) රු. 1.50 ට වැඩි වන නමුත් රු. 2.00 ට වැඩි නොවන විට ... ... | 0 20 |
| (ඉ) රු. 2.00 ට වැඩි වන නමුත් රු. 3.00 ට වැඩි නොවන විට ... ... | 0 30 |
| (ඊ) රු. 3.00 ට වැඩි වන නමුත් රු. 4.00 ට වැඩි නොවන විට ... ... ... | 0 40 |
| (උ) රු. 4.00 ට වැඩි වන නමුත් රු. 5.00 ට වැඩි නොවන විට ... ... ... | 0 50 |
| (ඌ) රු. 5.00 ට වැඩි වන නමුත් රු. 10.00 ට වැඩි නොවන විට ... ... ... | 1 0 |
| (ඍ) රු. 10.00 ට වැඩි වන විට— | |
| (1) පළමුවෙනි රු. 10.00 සඳහා ... ... | 1—0 |
| (2) ඊට අතිරේක වූ එක් එක් රු. 5 හෝ ඉන් කොටසක් සඳහා ... ... | 1 0 |

ජී. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ජූලි 27 වැනි දින,
කොළඹ දී ය.

8—1089—73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

## අවිස්සාවේල්ල නගර සභාව

### විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ අවිස්සාවේල්ල නගර සභාව විසින් සම්මත කර ගන්නා ලද පහත දැක්වෙන යෝජනාව, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලදුව, ඒ වගන්තියේ (2) උප වගන්තිය ප්‍රකාර පළ කරනු ලැබේ.

### යෝජනාව

"(267 වැනි අධිකාරය වන) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙම සභාව විසින්, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පැවැත්වෙන (ආඥාපනතෙහි විස්තර කොට ඇති පරිදි වූ) විනෝද කටයුතු සඳහා ඇතුළු වීම පිණිස අයකරනු ලබන ගාස්තු වලින්, 1947 අප්‍රේල් 25 වැනි දින අංක 9,693 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සම්මුතියෙන් එබඳු ගෙවීම් සඳහා පනවා අය කරන ලද බද්ද වෙනුවට මෙහි පහත දැක්වෙන ප්‍රමාණයන් අනුව වූ බද්දක් මේ යෝජනාව ගැසට් පත්‍රයෙහි පළ වන දින සිට, මෙයින් පනවා අය කරනු ලැබේ.

| ගෙවන මුදල<br>බදු ප්‍රමාණ හැර ඇතුළුවීමේ ගාස්තුව | බදු ප්‍රමාණය<br>රු. ශ. |
|---|---|
| (1) ශත 19 ට වැඩිවන නමුත් ශත 34 ට වැඩි නොවන විට ... ... ... | 0 05 |
| (2) ශත 34 ට වැඩිවන නමුත් ශත 44 ට වැඩි නොවන විට ... ... ... | 0 07 |
| (3) ශත 44 ට වැඩිවන නමුත් ශත 49 ට වැඩි නොවන විට ... ... ... | 0 09 |
| (4) ශත 49 ට වැඩිවන නමුත් ශත 59 ට වැඩි නොවන විට ... ... ... | 0 10 |
| (5) ශත 59 ට වැඩිවන නමුත් ශත 69 ට වැඩි නොවන විට ... ... ... | 0 12 |
| (6) ශත 69 ට වැඩිවන නමුත් ශත 74 ට වැඩි නොවන විට ... ... ... | 0 14 |
| (7) ශත 74 ට වැඩිවන නමුත් ශත 84 ට වැඩි නොවන විට ... ... ... | 0 15 |
| (8) ශත 84 ට වැඩිවන නමුත් ශත 94 ට වැඩි නොවන විට ... ... ... | 0 17 |
| (9) ශත 94 ට වැඩිවන නමුත් ශත 99 ට වැඩි නොවන විට ... ... ... | 0 19 |
| (10) ශත 99 ට වැඩිවන නමුත් රු. 1.24 ට වැඩි නොවන විට ... ... ... | 0 20 |
| (11) රු. 1.24 ට වැඩිවන නමුත් රු. 1.44 ට වැඩි නොවන විට ... ... ... | 0 25 |
| (12) රු. 1.44 ට වැඩිවන නමුත් රු. 1.49 ට වැඩි නොවන විට ... ... ... | 0 29 |
| (13) රු. 1.49 ට වැඩිවන නමුත් රු. 1.74 ට වැඩි නොවන විට ... ... ... | 0 30 |
| (14) රු. 1.74 ට වැඩිවන නමුත් රු. 1.94 ට වැඩි නොවන විට ... ... ... | 0 35 |
| (15) රු. 1.94 ට වැඩිවන නමුත් රු. 1.99 ට වැඩි නොවන විට ... ... ... | 0 39 |
| (16) රු. 1.99 ට වැඩිවන නමුත් රු. 2.29 ට වැඩි නොවන විට ... ... ... | 0 40 |
| (17) රු. 2.29 ට වැඩිවන නමුත් රු. 2.49 ට වැඩි නොවන විට ... ... ... | 0 46 |
| (18) රු. 2.49 ට වැඩිවන නමුත් රු. 2.99 ට වැඩි නොවන විට ... ... ... | 0 50 |
| (19) රු. 2.29 ට වැඩි වන නමුත් රු. 3.49 ට වැඩි නොවන විට ... ... ... | 0 60 |
| (20) රු. 3.49 ට වැඩිවන නමුත් රු. 3.99 ට වැඩි නොවන විට ... ... ... | 0 70 |
| (21) රු. 3.99 ට වැඩිවන නමුත් රු. 4.49 ට වැඩි නොවන විට ... ... ... | 0 80 |
| (22) රු. 4.49 ට වැඩිවන නමුත් රු. 4.99 ට වැඩි නොවන විට ... ... ... | 0 99 |
| (23) රු. 5.00 වන කල්හි හෝ රු. 5.00 ට වැඩිවන විට— | |
| (I) පළමුවන රු. 5.00 ට ... ... | 1 0 |
| (II) ඊටවැඩිවන හැම අමතර ශත 20 කට ... | 0 05 |

ජී. බී. වික්‍රමනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 ජූලි මස 30 වැනි දින,
කොළඹ දී ය.

8–1090—73.08.24 දින අංක 74 දරන ගැසට් පත්‍රය

---

## විශේෂ කොමසාරිස් කාර්යාලය—කහවත්ත නගරය

### සුළු නගර සභා ආඥාපනත

### 1973 වර්ෂය සඳහා වූ විශේෂ ජල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ කහවත්ත නගරයේ විශේෂ කොමසාරිස් විසින්, අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම හා නිදහස් කිරීම් වලට යටත්ව කහවත්ත නගරයේ පාලන සීමා ඇතුළත පිහිටි, මෙහි උප ලේඛනයේ නියමිත නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දෙකක් බැගින් වූ විශේෂ ජල බද්දක් පිළිවෙලින්, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි දී සමාන කොටස් දෙකකින් ගෙවිය හැකි වන සේ තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන කොමසාරිස් විසින් දෙන ලද අනුමතිය ඇතිව 1973 වර්ෂය සඳහා පනවා ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඩබ්ලිව්. ඊ. වී. එස්. ද අල්විස්,
පළාත් පාලන කොමසාරිස්.

1973 අගෝස්තු මස 06 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

#### අංක 1—නීලගම කොට්ඨාශය/නීලගම කෙළින් වීදිය

වරිපනම් අංක: 36, 38, 40, 46, 48, 50, 52, 54, 58, 64/4, 64/5, 64/6, 68, 70, 72, 76, 92, 92/1/1, 94, 33, 35, 37, 43/1, 47, 53.

#### අංක 2—කහවත්ත කොට්ඨාශය (ක) කෙළින් වීදිය

වරිපනම් අංක: 7, 15, 17, 19, 21, 23, 25, 27, 29, 31, 33, 35, 39, 39/1, 39/3, 43, 43ඒ, 45, 49, 53, 55, 59, 61, 63, 63/1, 65, 69, 71, 73, 75, 97, 99, 101, 105, 107, 109, 111, 113, 115, 117, 119, 121, 123, 123/1, 123/2, 125, 125ඒ, 131, 133, 135, 137, 139, 141, 143, 145, 149, 149/1, 157, 159, 161, 163, 165, 167, 173, 175, 177, 177ඒ, 179, 181, 183, 183ඒ, 185, 189, 189/1/1, 189/1, 191, 191/1, 191/2, 193, 199, 199/1, 199/2, 203, 205, 211, 217, 219, 221, 223, 225, 227, 231, 233, 235, 243, 245 247, 251, 255, 259, 263, 267, 285, 287, 299, 307, 135ඒ, 211/1, 189ඒ.

#### අංක 3—නුගවෙල කොට්ඨාශය (ක) කෙළින් වීදිය

වරිපනම් අංක: 4/1, 4/3, 4/4, 4/6, 6, 8, 10, 12, 12ඒ, 14, 18, 20, 20ඒ 26, 26/1, 18, 28ඒ, 28බී, 32, 34, 36, 38, 40, 42, 44/1, 46/4, 46/5, 46/6, 46/7, 48, 50, 54, 56, 58, 60, 62, 64, 66, 68, 74, 76, 78, 82, 84, 84ඒ, 86, 86ඒ, 88, 90, 92, 94, 100, 102, 102/1, 104, 106, 106ඒ, 108, 108ඒ, 110, 112, 112ඒ, 114, 116, 118, 118/1, 120, 122, 122ඒ, 124, 124/1, 124ඒ, 126, 126/1, 128/1ඒ, 128/2, 130, 134, 136, 138, 140, 142, 144, 148/1, 148/2, 148/3, 152, 154, 156, 158, 160, 160ඒ, 162, 164, 168, 168ඒ, 168/1, 168/7, 168/8, 168/9, 168/10, 168/11, 168/12, 168/18, 168/19, 168/20, 168/22, 168/23, 168/24, 170, 172, 174, 178, 178ඒ, 180, 182, 184, 186, 188/1, 190, 194, 228/2, 262, 262/1, 168/8, 168/1බී, 168/22ඒ, 156/1, 156/2, 156/3, 156/4.

#### අවන් පාර

වරිපනම් අංක: 5, 21/1, 21/12, 21/13, 23/1, 25, 8, 10, 12, 14.

#### පන්සල පාර

වරිපනම් අංක: 25, 27, 29, 35, 37, 39, 41, 43, 2, 4, 14, 24, 38.

#### එළුවාන පාර

වරිපනම් අංක: 2, 4, 8.

#### හවපෙ පාර

වරිපනම් අංක: 1, 3, 5, 7, 2, 4, 6, 14, 16, 18.

8–1093—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරිවිය යුතුය.)

6. විවාහක ද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

| සාමාන්‍ය අධ්‍යාපනය | | |
|---|---|---|
| **පාඨශාලාව හෝ විද්‍යාලය** | **සිට** | **දක්වා** |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

| වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|
| **විද්‍යායතනය** | **සිට** | **දක්වා** |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපනික සුදුසුකම් :

(අ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය/අ.පො.ස. (සාමාන්‍ය පෙළ)

| | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|---|
| පළවෙනි වාරය | | | | |
| දෙවැනි වාරය | | | | |

(ආ) අ.පො.ස. (උසස් පෙළ)—

| සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් | සම්මාන/විශිෂ්ට සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ඇ) වෙනත් උසස් අධ්‍යාපනික සුදුසුකම්—

| විභාගයේ නම | සමත් වූ වර්ෂය | විභාග අංකය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

(ඈ) සමර්ථ වී ඇති උසස්ම විභාගය :—

(i) සිංහල :————.

(ii) දෙමළ :————.

(iii) ඉංග්‍රීසි :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයන් හා අස් වූ දිනයන් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත හටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. **විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද, එසේ නම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස්ද ? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත් නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වූවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530, කොළඹ 1.

**පළාත් පාලන සේවය**

ආහාර පරීක්ෂක තනතුරු

පළාත් පාලන සේවයේ ආහාර පරීක්ෂක තනතුරු සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව ඉල්ලුම්පත් කැඳවයි.

2. **ඒකාබද්ධ වැටුප් ක්‍රමය.**—වර්ෂයකට රුපියල් 5,736—144×6—180×8 සහ 240×6—රු. 9,480.

නිල ඇඳුම් නොමිලයේ සපයනු ලැබේ.

3. **අවශ්‍ය සුදුසුකම්.**—ඉල්ලුම්කරුවන් මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂා ආයතනයේ (එංගලන්ත) සහතිකය ලබා තිබිය යුතුයි.

4. මේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි පිළියෙල කොට 73.09.24 වැනි දිනට හෝ ඊට පළමු පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර හෝ ඊට අදාළ අනිකුත් ලියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ යම්කිසි නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොවේ. පූර්වෝක්ත ආකෘති පත්‍රයෙහි 11 වන සහ 17 වැනි ශීර්ෂ වෙනුවට පහත සඳහන් කොට ඇති ශීර්ෂ යොදා ගත යුතුය :—

'11. (ඇ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) මස් සහ වෙනත් ආහාර සඳහා රාජකීය සනීපාරක්ෂක ආයතනයේ සහතිකය ලබා ගත් දිනය ;

(ii) දීමනා හැර, දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය ;

(iii) පළාත් පාලන ආයතනවල හෝ රජය යටතේ සේවා කාලය පිළිබඳ සටහන්, දරණ ලද තනතුරු හා කාල සීමාවන් ;

17. අත්සන.'

6. අයදුම්පතක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නො ලැබේ. අවසාන දින වනතුරු අයදුම්පත් එවීම ප්‍රමාද කරන අපේක්ෂකයෝ තුමූම ඒ අවදානමට මූණ පාති.

7. නියමිත දිනට පසුව රජයේ හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයක සේවය කරන නිලධාරීන්ගෙන් කාර්යාලයට ලැබෙන අයදුම් පත්‍ර අවසාන දිනට පළමු ඒ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා වෙත ලැබී ඇති බවට සහතික කර, ප්‍රමාදය පිළිගත හැකි හේතු දක්වමින්, ඒ අයදුම් පත්‍ර පිළිගන්නා ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ප්‍රාදේශීය බලමණ්ඩලයේ ප්‍රධානියා විසින් නිර්දේශ කරනු ලැබුවහොත් මිස, සළකා බලනු නොලැබේ.

8. සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට පමණක්, ඉල්ලුම් පත්‍ර ලැබුණ බව දන්වා එවනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
ලේකම්,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව.

1973 අගෝස්තු මස 11 දින,
තැ. පෙ. 530—කොළඹ.

8–981—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් පාලන සේවය**

5 වැනි ශ්‍රේණියේ ලේකම්වරුන් බඳවා ගැනීමේ විභාගය
**1972.10.21**

1973.06.29 වැනි දින ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ පලකරන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව 5 වැනි ශ්‍රේණියේ ලේකම් තනතුරුවලට පත්කිරීම් සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂකයින්ගේ නම්වලට අමතරව පහත නම් සඳහන් අපේක්ෂකයාද එම තනතුරට පත් කිරීමට තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

1. කේ. කේ. රාජරත්නම්—කොළඹ නගර සභාව.

මෙම අපේක්ෂකයාට වහාම පත්වීමක් දීමට කොමිෂන් සභාව භාර ගනු නොලැබේ. පුරප්පාඩු ඇතිවූ විට ඔහුටද පත්වීමක් දෙනු ලැබේ.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 අගෝස්තු මස 10 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

8–912—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

**පළාත් පාලන සේවය**

5 වැනි ශ්‍රේණියේ ලේකම්වරුන් බඳවා ගැනීමේ විභාගය
**1971.09.25**

1972.09.29 හා 1973.03.09 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ 4 වැනි කොටසේ පලකරන ලද ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව 5 වැනි ශ්‍රේණියේ ලේකම් තනතුරුවලට පත්කිරීම සඳහා තෝරා ගන්නා ලද අපේක්ෂයින්ගේ නම්වලට අමතරව පහත නම සඳහන් අපේක්ෂකයාද එම තනතුරකට පත් කිරීමට තෝරා ගන්නා ලද බව මෙයින් දන්වනු ලැබේ.

1. ඩී. ඇල්. දසනායක—කොළඹ නගර සභාව.

එඩ්ගා ප්‍රනාන්දු,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ
ලේකම්.

1973 අගෝස්තු මස 10 දින,
තැ. පෙ. 530, කොළඹ,
පළාත් පාලන සේවා කොමිෂන් සභා කාර්යාලය.

8–913—73.08.24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

එල්ජී—බී. 43/47

**හපුතලේ නගර සභාව**

**නගර සභා ආඥාපනත**

(255 වන අධිකාරය වූ) නගර සභා ආඥාපනතේ 153 වන හා 157 වන වගන්ති යටතේ හපුතලේ නගර සභාව විසින් සාදනු ලැබ එකී ආඥාපනතේ 154 වන වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අගෝස්තු 14 දින,
කොළඹදීය.

**අතුරු ව්‍යවස්ථාව**

1. වෙළඳ පොළවල් සම්බන්ධයෙන් සභාව විසින් සාදනු ලැබ 1948 මැයි 14 වන දින අංක 9863 දරන ගැසට් පත්‍රයෙහි පළකරන ලදුව වරින් වර සංශෝධිත අතුරු ව්‍යවස්ථා පහත දක්වෙන අයුරු මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) 1 වන අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. හපුතලේ වෙළඳ පොළ සඳහා වෙළඳ ප්‍රදේශය හපුතලේ නගර සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය විය යුතුය ;" සහ

(2) 17 වන අතුරු ව්‍යවස්ථාවේ (1) වන සහ (2) වන ඡේද වෙනුවට පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"17. (1) සභාව විසින් හපුතලේ පිහිටුවා ඇති ඉරිදා පොළට හෝ නියමිත ස්ථානවල වෙළඳාම් නොකරන සංචාරක වෙළෙන්දන්ට මෙම අතුරු ව්‍යවස්ථාව අදාළ විය යුතුය,

(2) පහත සඳහන් ආකාරයෙන් ගණන් බලනලද ගාස්තුවක් ගෙවා පළතුරු, එළවළු, අල වර්ග, හකුරු, පොල්, මාළු, කරවල ඇඳුම්, විවිධ වෙළෙඳ බඩු හා ගෙවතුවල හෝ හේන්වල වගා කරන දේවල්, ඒ දේවල් වවන හෝ නිපදවන අයම විසින්, සතියේ ඕනෑම දිනක, වෙළඳ ප්‍රදේශය තුළ විකිණීම හෝ විකිණීම සඳහා ප්‍රදර්ශනය කළ හැකිය :—

(අ) ඉරිදා පොළ භූමියෙහි සෑම වර්ග අඩියක බිම් ප්‍රමාණයක් සඳහාම ශත 05 ක ගාස්තුවක්.

(ආ) සෙසු ස්ථානයන් හි—

(i) බරින් රාත්තල් 100 කට වැඩි නොවන යම් එළවළු ප්‍රමාණයකට ශත 25ක ගාස්තුවක්,

(ii) බරින් රාත්තල් 100 කට වැඩිවන යම් එළවළු ප්‍රමාණයකට ශත 50ක ගාස්තුවක්,

(iii) තක්කාලි වැනි, රාත්තල් 40 කට වඩා බරින් වැඩි සෑම තක්කලි ප්‍රමාණයකටම ශත 25ක ගාස්තුවක්,

(iv) ඉහත සඳහන් වෙළඳ බඩු අලෙවි කරන සෑම කුඩා වාහනයක් සඳහා දිනකට රු. 1ක ගාස්තුවක්,

(v) ඉහත සඳහන් වෙළඳ බඩු අලෙවි කරන සෑම ලොරියක් සඳහා දිනකට රු. 2ක ගාස්තුවක්."

8-1094 —73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## බේරුවල නගරය

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 153 සහ 157 වැනි වගන්ති යටතේ ඒ සඳහා උචිත බලධරයා වන බේරුවල නගරයේ විශේෂ කොමසාරිස් විසින් සාදන ලදුව එම ආඥාපනතේ 154 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අගෝස්තු 14 දින,
කොළඹදීය.

### ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම හා සලකා බැලීමට අදාල අතුරු ව්‍යවස්ථා

1. අළුතින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා හෝ පවත්නා ගොඩනැගිලි වෙනස් කිරීම සඳහා හෝ (268 වැනි අධිකාරය වන) නිවාස හා නගර සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කරනු ලබන සැලසුම් පරීක්ෂා කර බැලීම හා සලකා බැලීම සම්බන්ධයෙන් මේ සමග ඇති උපලේඛනයේ නියමිත ගාස්තු ප්‍රමාණයට අනුව, නිගමනය කරනු ලබන ගාස්තුවක් ගෙවිය යුතුය.

2. 1 වන අතුරු ව්‍යවස්ථාව යටතේ ගෙවිය යුතු ගාස්තුව ගෙවන ලෙස නියම කරමින් බේරුවල නගරයේ විශේෂ කොමසාරිස් වරයාගෙන් ලිපියක් ලැබුණු විට විශේෂ කොමසාරිස් වරයාගේ අනුමැතිය හෝ කැමැත්ත සඳහා අයදුම්පත ඉදිරිපත් කරන්නා විසින් එම ගාස්තුව ගෙවිය යුතුය. එම ගාස්තුව ගෙවන තුරු කිසිම සැලැස්මක් පරීක්ෂා කිරීම හෝ සලකා බැලීම හෝ නොකළ යුතුය.

### උපලේඛනය

1. අළුත් ගොඩනැගිලි ඉදිකිරීම සම්බන්ධයෙන් හෝ පවතින ගොඩනැගිල්ලක ගෙබිමේ වර්ග ප්‍රමාණය වැඩිවන අයුරු එය වෙනස් කිරීම සම්බන්ධයෙන් හෝ ඉදිරිපත් කෙරෙන සැලසුම් සඳහා—

| | රු. | ශ. |
|---|---|---|
| (අ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 500 කට වැඩි නොවන කල්හි ... | 2 | 50 |
| (ආ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 500 ට වැඩි නමුත් වර්ග අඩි 1,000 ට වැඩි නොවන කල්හි ... ... | 5 | 0 |
| (ඉ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 1,000 ට වැඩි වන නමුත් වර්ග අඩි 1,500 ට වැඩි නොවන කල්හි ... ... | 15 | 0 |
| (ඊ) ගෙබිමේ සම්පූර්ණ වර්ග අඩි ප්‍රමාණය වර්ග අඩි 1,500 ට වැඩි නමුත් වර්ග අඩි 2,000 ට වැඩි නොවන කල්හි | 25 | 0 |
| (උ) ගෙබිමේ සම්පූර්ණ වර්ග ප්‍රමාණය වර්ග අඩි 2,000 ට වැඩිවන නමුත් වර්ග අඩි 3,000 ට වැඩි නොවන කල්හි ... ... | 30 | 0 |
| (ඌ) මීට අමතර වශයෙන් වර්ග අඩි 1,000 ක ඒකකයකට හෝ ඉන් කොටසකට ... | 15 | 0 |
| 2. ගෙබිමේ වර්ග ප්‍රමාණය වර්ග අඩි 500 ට වැඩි පවත්නා ගොඩනැගිලි වල ගෙබිමේ වර්ග ප්‍රමාණය වැඩි නොවන වෙනස් කිරීම් සම්බන්ධයෙන් වන සැලසුම් සඳහා ... | 10 | 0 |
| 3. සැලසුම් අළුතින් ඉදිරිපත් නොකර අනුමැතිය අළුත් කර ගැනීම සඳහා ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍ර සඳහා... | 10 | 0 |

මෙම උපලේඛනයෙහි "ගෙබිම" යන්නෙන් බිම් මාලයෙහි හෝ වෙනත් මාලයක බිම ඉඩකඩ අදහස් වේ.

8-1095—73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

1961 අංක 60 දරන පනතින් සංශෝධිත (257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 42 වැනි වගන්තිය යටතේ රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්පාදිතව එම වගන්තියේ (3) වැනි උප වගන්තියෙන් තමාවෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරනලද අතුරු ව්‍යවස්ථා.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අගෝස්තු 8 වැනි දින,
කොළඹදීය.

### ජල සම්පාදනය පිළිබඳ අතුරු ව්‍යවස්ථා

1953 දෙසැම්බර් 23 වැනිදින අංක 10,625 දරණ ගැසට් පත්‍රයේ පළකරනලද යෝජනාවෙන්, රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලන් කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කරගන්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා—එහි XXVIII වැනි කාණ්ඩයේ 1 වැනි 11 වැනි හා 16(2) හා 28 වැනි අතුරු ව්‍යවස්ථාවලට පහතින් මෙහි පහත සඳහන් ව්‍යවස්ථා එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරණු ලැබේ:—

### අර්ථ නිරූපණය

1. (1) මේ අතුරු ව්‍යවස්ථාවල—

"සභාපති" යනුවෙන් සභාවේ සභාපතිවරයා අදහස් කරණු ලැබේ.

"සභාව" යනුවෙන් අටකලන්කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාව අදහස් කරණු ලැබේ.

තවද ජලසම්පාදනයට සම්බන්ධ ව්‍යවහාර කෙරෙන "ගෘහකාර්ය" යන්නට විකිණීම පිණිස හෝ කුලියටදීම පිණිස අශ්වයන් ගවයන් හෝ රථවාහන තබාගෙන ඇති විට ඒ අශ්වයන් ගවයන් හෝ රථවාහන සඳහාවූ වතුර හෝ ඒ අශ්වයන්, ගවයන් හෝ රථවාහන සේදීම සඳහාවූ වතුර හෝ යම් කර්මාන්තයක්, නිෂ්පාදනයක් හෝ ව්‍යාපාරයක් සඳහාවූ වතුර හෝ වතුර මලක් සඳහා හෝ පිහිනුම් තටාකයක් සඳහා හෝ සැරසිලි හෝ යාන්ත්‍රික කාර්යයන් සඳහා හෝ වාරිමාර්ග කාර්යයන් සඳහා හෝ යම් ගොඩනැගිල්ලක් හෝ පාරක් තැනීම සඳහාවූ වතුර ඇතුලත් නොවේ.

### පොදු වතුර පයිප්ප කණු

11. (2) පෞද්ගලික ජල සේවාවන් තැනීම සඳහා පාවිච්චිකරණු ලබන සියළු ගැල්වනයිස් වාත්තුකල යකඩ නළවල ස්කුරුප්පු කැපූ සන්ධි හා තව් තිබිය යුතුවාත් හැර, හතරැස් අඟලකට පීඩනය රාත්තල් 200ක් විය යුතුය. තවද, පහත දක්වෙන බර ප්‍රමාණයන්ට අනුකූල විය යුතුය :—

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් $\frac{1}{2}$, දිග අඩි 100ට රාත්තල් 88යි.

ඇතුල්පැත්තේ විශ්කම්භය අඟල් $\frac{3}{4}$ දිග අඩි 100ට රාත්තල් 125 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 1 දිග අඩි 100ට රාත්තල් 181 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් $1\frac{1}{4}$ට දිග අඩි 100ට රාත්තල් 256 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් $1\frac{1}{2}$ දිග අඩි 100ට රාත්තල් 320 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 2 දිග අඩි 100ට රාත්තල් 405 යි.

(3) පෞද්ගලික ජල සේවාවක් තැනීම සඳහා පාවිච්චි කරණ සියලුම තඹ නළවල පීඩනය වර්ග අඟලකට රාත්තල් 200ක් වියයුතු අතර, ඒවා පහත දක්වෙන බර ප්‍රමාණයට අනුකූල විය යුතුය :—

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් ½ දිග අඩි 100ට රාත්තල් 27 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් ¾ දිග අඩි 100ට රාත්තල් 39 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 1 දිග අඩි 100ට රාත්තල් 62 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 1¼ දිග අඩි 100ට රාත්තල් 76 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 1½ දිග අඩි 100ට රාත්තල් 91 යි.

ඇතුල් පැත්තේ විශ්කම්භය අඟල් 2 දිග අඩි 100ට රාත්තල් 140 යි.

(4) පෞද්ගලික ජල සේවයක් සඳහා පාවිච්චිකරණ සියලුම පොලිතින් පයිප්ප 1972 : 1953 බ්‍රිතාන්‍ය සම්මතයට අනුව (ශීත ජල සේවය සඳහා අඩු පීඩනය සහිතවූ පොලිතින් බටයක්) වැඩිවන උෂ්නත්වයත් සමග වේගය අඩුවීමේ අවකාශයක් ඇතිව තනා තිබිය යුතු අතර, එබඳු නළ අංශක 100ක උෂ්නත්වයකදී අඩි 150ක අඩුම ක්‍රියාත්මක පීඩනයක් සඳහා සුදුසු වියයුතුය.

(5) යම්කිසි පෞද්ගලික ජල සේවයක් සඳහා පාවිච්චි කරණ පොලිවිනිල් ක්ලෝරයිඩ් නළ පහත දක්වෙන බර ප්‍රමාණය අනුව තිබිය යුතුයි.

| පයිප්පයේ ඇතුලත විශ්කම්භය අඟල් වලින් | දිග අඩි 100කට බර රාත්තල්වලින් |
|---|---|
| ½ | 16 ·8 |
| ¾ | 20 ·4 |
| 1 | 29 ·6 |
| 1¼ | 35 ·6 |
| 1½ | 51 ·8 |
| 2 | 73 ·9 |

තවද, ක්‍රියාත්මක පීඩනය මෙහි පහත සඳහන් අයුරු විය යුතුයි :—

| පයිප්පයේ ඇතුලත විශ්කම්භය අඟල්වලින් | | අංශක 75කදී ක්‍රියාත්මක පීඩනය ජල අඩිවලින් | | අංශක 150කදී ක්‍රියාත්මක පීඩනය ජල අඩිවලින් |
|---|---|---|---|---|
| ½ | ... | 1,220 | ... | 657 |
| ¾ | ... | 980 | ... | 530 |
| 1 | ... | 922 | ... | 495 |
| 1¼ | ... | 760 | ... | 415 |
| 1½ | ... | 610 | ... | 322 |
| 2 | ... | 610 | ... | 322 |

(6) යම් පෞද්ගලික ජල සේවයක් තැනීම සඳහා පාවිච්චි කරන සියලුම වීනච්චට්ටි නළ ස්ථිර වශයෙන් ඊයම් හා නූල් වලින් සන්ධි කල යුතුයි.

(7) යම් පෞද්ගලික ජල සේවයක් තැනීම සඳහා පාවිච්චි කරණ සියලුම ඊයම් නළ ඊයම්වලින් පාස්සනලද සන්ධිවලින් යුක්ත එවිය යුතුයි.

### ජලය සැපයීමේ ගාස්තු

16. (3) (අ) ගෘහ කාර්යයන් සඳහාවූ ජලය මාපකයකින් හෝ වෙන ආකාරයකින් සැපයිය යුතුය.

(ආ) ගෘහ කාර්යයන් සඳහාවූ ජලය මාපකයකින් සැපයෙන අවස්ථාවක ඒ ජලය සඳහා ගාස්තුව පහත සඳහන් ගණන් ප්‍රමාණයන් අනුව අදල ස්ථානය අයිතිකරු හෝ පදිංචිකරු හෝ විසින් සභාව වෙත ගෙවිය යුතුයි.

| | ගාස්තුව රු. ශ. |
|---|---|
| එක් මාසයක් තුලදී සැපයෙන පළමුවෙනි ගැලුම් 3,000ට අයකිරීමක් නැත. පළමුවැනි ගැලුම් 3,000ට අතිරේක වශයෙන් එක් මාසයක් තුළදී හෝ එයින් කොටසක් තුලදී හෝ සැපයෙන සෑම ගැලුම් 1,000ට හෝ එයින් කොටසකට හෝ ... ... | 30 |

(ඇ) ඉහත සඳහන් ගාස්තු යෝජනා මගින් විටින් විට සභාව විසින් වෙනස් කල හැකිය.

(ඈ) මාපකයකින් නොව වෙන ආකාරයකින් ගෘහ කාර්යයන් සඳහා වූ ජලය සැපයෙන අවස්ථාවක පහත දක්වෙන ගාස්තු සභාව වෙත කලින් ගෙවිය යුතුය.

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් ½ කරාමයක් සහිතවූ පෞද්ගලික සේවා සම්බන්ධකයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... | 2 | 50 |
| අඟල් ½ යේ සෑම අතිරේක කරාමයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... ... | 2 | 50 |
| අඟල් ¾ කරාමයක් සඳහාවූ පෞද්ගලික සේවා සම්බන්ධකයක්, සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... | 5 | 0 |
| අඟල් ¾ සෑම අතිරේක කරාමයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... | 5 | 0 |
| අඟල් 1ක කරාමයක් සහිතවූ පෞද්ගලික සේවා සම්බන්ධකයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| අඟල් 1ක සෑම අතිරේක කරාමයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... ... | 7 | 50 |

(4) (අ) ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලය මාපකයකින් හෝ වෙන ආකාරයකින් සැපයියහැකිය.

(ආ) ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලය මාපකයකින් සැපයෙන අවස්ථාවක ඒ සඳහා ගාස්තු ගැලුම් 1,000ට හෝ ඉන් කොටසකට රු. 1 බැගින් ගණන් බැලිය යුතුය.

(ඇ) ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලය මාපකයකින් නොව වෙන ආකාරයකින් සැපයෙන විට පහත සඳහන් ගාස්තු සභාව වෙත කලින් ගෙවිය යුතුය.

භෝජන ශාලාවක්, බත් කඩයක්, තේ කඩයක් හෝ බේකරියක්, ලැගුම් හලක්, නේවාසිකාගාරයක්, හෝ වෙනත් කිසියම් කාර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් සඳහා සම්පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් පාවිච්චි කරන ස්ථානයක් සම්බන්ධයෙන්—

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් ½ක කරාමයක් සහිතවූ පෞද්ගලික සේවා සම්බන්ධකයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... | 8 | 0 |
| අඟල් ½ක සෑම අතිරේක කරාමයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... ... | 5 | 0 |
| අඟල් ¾ ක කරාමයක් සහිතවූ පෞද්ගලික සේවා සම්බන්ධකයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| අඟල් ¾ ක සෑම අතිරේක කරාමයක් සඳහා එක් මාසයකට හෝ ඉන් කොටසකට ... ... ... | 8 | 0 |

### ජල මාපක යන්ත්‍ර

16 (5) සභාවේ ජල කර්මාන්තයකින් යම් ස්ථානයකට සපයන ජලය මනින සියලු මාපක යන්ත්‍ර ගම්සභාව විසින් සපයා සවිකළ යුතුවා පමණක් නොව, ඒවා ගම්සභාව සතු දේපල වශයෙන් තිබිය යුතුය.

(6) මාපක යන්ත්‍ර සවිකිරීමට (කම්කරුවන්, උපකරණ හා පරිපාලනයද ඇතුළුව) යන වියදම් ජලය සපයනු ලබන ස්ථානයේ අයිතිකරු හෝ පදිංචිකරු විසින් කලින් ගෙවිය යුතුය.

(7) මාපක යන්ත්‍රයකින් ජලය සපයනු ලබන ස්ථානය අයිතිකරු හෝ පදිංචිකරු විසින් ජල මාපක යන්ත්‍ර නඩත්තු කිරීමට හෝ අළුත් වැඩියා කිරීමට යන වියදම ගෙවීමට යටත් නොවිය යුතුය.

එසේ වුවද, ඒ අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් ඕනෑකමින්ම කළ ක්‍රියාවකින් හෝ ඔහුගේ නොසැළකිළිමත් කමකින් සිදුවූ යම් හානියක් නිසා, ජල මාපක යන්ත්‍රය අළුත් වැඩියා කිරීම හෝ අලුත් කිරීම අවශ්‍ය වුවහොත් ඒ අළුත් වැඩියා කිරීම හෝ අලුත් කිරීම සඳහා යන වියදම සභාපතිවරයා විසින් ඉල්ලුම්කළ විට සභාවට ගෙවිය යුතුය.

16 (8) (අ) ජල මාපක යන්ත්‍රයක් මගින් ජලය සපයනු ලබන යම් ස්ථානයක අයිතිකරු විසින් හෝ පදිංචිකරු විසින් මාපක යන්ත්‍ර පාවිච්චි කිරීම වෙනුවෙන් කාර්තුවක් හෝ ඉන් කොටසක් සඳහා පහත දක්වෙන ප්‍රමාණ අනුව ගණන් බලන ලද කුලියක් කාර්තුවකට වරක් බැගින් සභාවට කලින් ගෙවීම හෝ ගෙවීමට සැලැස්වීම කළ යුතුය—

| | රු. | ශ. |
|---|---|---|
| අඟල් 2 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් ... ... | 25 | 0 |
| අඟල් 1½ ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් ... ... | 20 | 0 |
| අඟල් 1 ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් ... ... | 15 | 0 |
| අඟල් ¾ ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් ... ... | 10 | 0 |
| අඟල් ½ ජල මාපක යන්ත්‍රයක් වෙනුවෙන් ... ... | 5 | 0 |

(ආ) මෙ අතුරු ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා කාර්තුවක් යන්නෙන් එක් එක් අවුරුද්දේ ජනවාරි මස 1 වෙනි දිනෙන් හා අප්‍රෙල් මස 1 වැනි දිනෙන් හා ජූලි මස 1 වැනි දිනෙන් හා ඔක්තෝම්බර් මස 1 වැනි දිනෙන් ආරම්භ වන අනුක්‍රමික මාස තුනක කාල සීමාවක් අදහස්වේ.

(9) (අ) යම් කාර්තුවක පාවිච්චි කරන වතුර ප්‍රමාණය පිළිවෙලින් ඒ කාර්තුවේ ආරම්භයේදී හා ඒ කාර්තුව අවසානයේදී මාපක යන්ත්‍රයේ සඳහන්ව තිබුන සටහන් අතර ගණන් ගැනීමෙන් මෙ අතුරු ව්‍යවස්ථාවේ මීළඟට සඳහන් විධිවිධානවල නිශ්චිතව සඳහන් ආකාරයට ගණන් බැලිය යුතුය.

(ආ) අලුතෙන් සවිකරනලද ජල මාපක යන්ත්‍රයක් සම්බන්ධයෙන්වූ විට, එය සවිකරන විට සඳහන්ව තිබුන ගණනද අනෙක් යම් විටක නම්, පෙරාතුවම වූ කාර්තුව වෙනුවෙන් අන්තිමට සඳහන්ව තිබුණ ගණනද පළමු වැනි ගණන් ගැනීම විය යුතුය. යම් කාර්තුවක් සඳහා අන්තිමට ගණන් ගැනීම ඒ කාර්තුව ඉකුත්වන දිනට පෙරදින දහයක් හෝ ඒ කාර්තුව ඉකුත් වීමෙන් පසු දින දහයක් ඇතුළත දිනයකදී කෙරෙන ගණන් ගැනීම විය යුතුය.

ආපසු ගෙවිය යුතුය. ඇත්ත වශයෙන්ම ගිය වියදම ඇස්තමේන්තුගත වියදමට වඩා වැඩි වුවහොත් එසේ වැඩිවූ ගණන කර්මාන්තය සම්පූර්ණ කරණු ලැබීමෙන් පසුව අයිතිකරු විසින් හෝ පදිංචි කරු විසින් වහාම සභාව වෙත ගෙවිය යුතුය.

### සාමාන්‍ය

37. (අ) ජල කර්මාන්තයේ ඇති ජලය ප්‍රමාණවත් නොවේයයි, හෝ (ආ) ප්‍රධාන ජලනළ හෝ ජල කර්මාන්තය විශාල කිරීමේ, වෙනස් කිරීමේ හෝ අළුත් වැඩියා කිරීමේ කාර්ය සඳහා හෝ ප්‍රධාන ජල නළවලට සේවා නළ සම්බන්ධ කිරීමේ කාර්ය සඳහා යම් ක්‍රියාවක් යෝග්‍යයි හෝ අවශ්‍යයි, හෝ

(ඇ) පොදු ජලකනුවකට යම් හානියක් හෝ එහි ජලය අපවිත්‍ර වීමක් හෝ අපතේ යෑමක් සිදුවීමේ හේතුව නිසා යම් ක්‍රියාවක් යෝග්‍යයි හෝ අවශ්‍යයි, හෝ

(ඈ) ගින්නක් හටගැනීමෙන් ජලකර්මාන්තයට ඒ හානිය සිදුවූයේයයි නැතහොත් සිදුවීමට ඉඩ තිබේයයි සභාපතිට ඒත්තුයන කවරඅවස්ථාවකදී වුවද ආඥාපනත් හෝ මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාවට අයවියහැකි හෝ අයවියයුතුව තිබෙන යම් වතුර බද්දකට හෝ ජලමාපක යන්ත්‍ර බද්දකට හෝ වෙන මුදලකට හානියක් නොවන පරිදි ජලය සැපයීම තාවකාලිකව නතර කිරීම, අත්හිටුවීම, අඩුකිරීම, නතර කිරීම හෝ සභාවේ ජළ කර්මාන්-තයට සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් සම්බන්ධ කොටඇති වතුර මල් වලින්, සේවා නළ වලින් හෝ වෙන උපකරන වලින් හෝ ඒවා මාර්ගයෙන් ඉවත් කිරීම හෝ වෙන අතකට හැරවීම සභාපති විසින් කළ හැකිය.

38. 15 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් පෞද්ගලික සේවා නළයක් හෝ සවිකිරීමක් සඳහාවූ අනුමැතිය හෝ ඒ සේවා නළය දමනු ලබන ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට මේ අතුරු ව්‍යවස්ථාවල යම් අතුරු ව්‍යවස්ථාවක් යටතේ යම් අවසරයක් හෝ අනුග්‍රහයක් දීම නළයේ යම් කොටසක් පුපුරායාමෙන් සිදුවියහැකි යම් හානියක් හෝ නළය සවිකිරීමේ යම් කොටසකින් ජලය පිටාර ගලායාමක් සම්බන්ධයෙන් යම් කාර්යයක් සඳහා වගකීමට සභාව බැඳී සිටින සේ නොසැලකිය යුතුය.

39. කොන්ත්‍රාත්තුවක් හෝ ගිවිසුමක් යටතේ හෝ වෙනත් යම් අන්දම කින් හෝ ජලය සැපයීමට සභාව අපොහොසත්වීම සම්බන්ධයෙන්, ඒ අපොහොසත්වීම අසාමාන්‍ය නියඟයක් හේතු කොට ගෙන හෝ කර්මාන්තයක් කර ගෙන යනු ලැබීම නිසා තාවකාලික වශයෙන් සිදුවිය හැකි අවහිරයක් හේතු කොට ගෙන හෝ වෙනයම් වැලැක්විය නොහැකි හේතුවක් හෝ බලාපොරොත්තු නොවූ සිද්ධියක් නිසා වෙයි නම් හානි ගැන වගකීමට සභාව යටත් නොවිය යුතුය.

40. (1) යම් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිලි සෑදීමේ කාර්යයක් සඳහා සභාවේ ජල කර්මාන්තයේ තාවකාලික සම්බන්ධ කිරීමකින් යම් ස්ථානයකට ජලය සපයනු ලබන අවස්ථාවක ඒ ගොඩනැගිල්ල හෝ ඒ ගොඩනැගිලි තනා අවසන් කරනු ලැබීමෙන් පසුව එහි ජලය සැපයීම නතර කළ යුතුය.

(2) (1) වෙනි ඡේදයේ සඳහන් කාර්ය සඳහා ජලය සැපයීමේ ගාස්තු 16(4) (ඇ) වැනි අතුරු ව්‍යවස්ථාවෙහි නියමිත ප්‍රමාණයන් අනුව විය යුතුයි.

41. මේ අතුරු ව්‍යවස්ථා යටතේ සභාව වෙත ගෙවිය යුතු සියළුම මුදල් සභාපති වෙත හෝ සභාපති විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නිළධාරියෙකු වෙත ගෙවිය යුතුය.

### මේ අතුරු ව්‍යවස්ථා කඩකිරීම සඳහා වූ දණ්ඩනය

42. මේ අතුරු ව්‍යවස්ථාවලින් යම් අතුරු ව්‍යවස්ථාවක් උල්ලංඝණය කරන සෑම අවස්ථාවකදීම රුපියල් පනහකට වැඩි නොවන දඩයක් සහිත දඩුවම් දියයුතු අතර, ඒ වරද දිගටම කරගෙන ගියහොත් ඒ වරද ගැන වරදකරු බව ඔප්පුවූ පසු හෝ ඒ උල්ලංඝනය සිහිපත්කරවා සභාපති විසින් හෝ සභාපති විසින් බලය පවරන ලද නිළධරයකු විසින් දැන්වීමක් භාරදීමෙන් පසු කාලයතුල එසේ වරද කරගෙන යන එක් එක් දිනකට රුපියල් දහයට වැඩි නොවන අතිරේක දඩයක් සහිත දඩුවම් පැමිණවිය යුතුය.

### උපලේඛනය

### "අ" ආකෘති පත්‍රය

අංකය :————.

අටකලන්කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සභාපතිවරයා වෙතටයි.

මීට යාකොට ඇති උපලේඛනයේ දක්වා ඇති ආකාරයට........................................කොට්ඨාශයේ..............................වීථියේ ............ වැනි අංකය දරන ස්ථානයේ ගෙට පෞද්ගලික ජල සේවය :—

* දැමීම
* වෙනස් කිරීම
* දීර්ඝ කිරීම
* සුද්ධ කිරීම

සඳහා ඔබේ අනුමැතිය ලියවිල්ලකින් දෙනලෙස මෙයින් ඉල්ලා සිටිමි.

* බදු කාරයෙක් පදිංචිවී සිටීනම් වාර්ෂික බද්ද රු. :————.
* අයිතිකාරයා පදිංචිවී සිටීනම් වාර්ෂික වටිනාකම් රු. :————.
* දැනට තිබෙන සේවයේ ප්‍රමාණය :————.

ජලය වුවමනාකරන්නේ ගෘහ කාර්යයක් සඳහාද නැතහොත් ගෘහ කාර්යයක් නොවන වෙනත් කාර්යයක් සඳහාද යනවග :————.

ස්ථානය පාවිච්චි කරන්නේ කුමන කටයුත්තක් සඳහාද යනවග :————.

තැන්පත්කල මුදල රු. :————.

### උපලේඛනය

| පෞද්ගලික ස්ථානයකට නළ දැමීම | | කරාම | | | ජලභාජන | |
|---|---|---|---|---|---|---|
| දිග | ප්‍රමාණය | ගණන | පිහිටීම | ප්‍රමාණය | වතුර අල්ලන ප්‍රමාණය | පිහිටීම |
| | | | | | | |

වෙනත් කරුණු :————.

(පැහැදිලිලෙස ලියනු මැනවි)

* අයිතිකාරයාගේ අත්සන :————.
* අයිතිකාරයාගේ නම :————.
* අයිතිකාරයාගේ ලිපිනය :————.
* පදිංචිකාරයාගේ අත්සන :————.
* පදිංචිකාරයාගේ නම :————.
* පදිංචිකාරයාගේ ලිපිනය :————.
* අනවශ්‍ය වචන කපාහා දමන්න.

### කාර්යාලයේදී පිරවීම පිණිසයි

අනුමත කරන ලදී.

.........................................
සභාපති.

අටකලන්කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ
ගම්සභාවේ සභාපති.

මුදල බැරකල දිනය :————.

ජල කර්මාන්ත අංශයට යැවූ දිනය :————.

වැඩ අවසන් කිරීමෙන් පසුව වාර්තාව ලැබූ දිනය :————.

කරාමවල පිහිටීම පෙන්නුම් කරමින් ස්ථානයේ තනි රේඛා සැලැස්මක් පහත සඳහන් කරනු.

සංලක්ෂ්‍යය— (1) ජල සේවය සඳහා එවන සියලුම ඉල්ලුම් පත්‍ර "අ" අක්ෂරය දරන නිල ආකෘති පත්‍රයෙහි ඉදිරිපත් කල යුතුය.

(2) ජල සේවය සඳහා එවන සියලුම ඉල්ලුම් පත්‍ර සභාව විසින් අනුමත කල යුතුය.

(3) පෞද්ගලික ජල සේවයක් සඳහා අවසර දුන්විට, ඒ සේවයෙන් ජලය සපයන ස්ථානයේ සභාවේ ප්‍රධාන ජල නළවලට හෝ උපකාරක ප්‍රධාන ජල නළවලට සම්බන්ධ කිරීම සභාපති විසින් බලය පවරන ලද සභාවේ නිලධරයෙකුගේ පරිපාලනය යටතේ කල යුතුය.

(4) පෞද්ගලික ජල සේවයක් වෙනුවෙන් රු. 20ක ගාස්තුවක් ගෙවිය යුතුය.

(5) ජල නළ හා උපකරන දැමීම හා සවිකිරීම, සභාපති විසින් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තන් විසින් පමණක් කල යුතුය. එසේම සභාපති විසින් බලය පවරනු ලැබූ සභාවේ නිළධරයකු විසින් අනුමත කරන තුරු ඒ නළය සහ සවිකිරීම පාවිච්චි නොකළ යුතුය.

(6) ගෘහ කාර්යයක් නොවන වෙනත් කාර්යයන් සඳහා සපයන ජලය වෙනුවෙන් ගාස්තුව ජල මාපක යන්ත්‍රයෙහි වැටෙන ගණන් අනුව හෝ ජල මාපක යන්ත්‍ර සවිනොකර ඇති අවස්ථාවක 16 වන අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ගාස්තු ප්‍රමාණ අනුව ගෙවිය යුතුය.

(7) පුද්ගලික ජල සේවයක් පිහිටුවා ඇති ගෙයක හෝ ස්ථානයක අයිතිකරු හෝ පදිංචිකරු විසින් පදිංචිකරු මාරුවීයාමට ආසන්න කවර විටකදී වුව, ඒ බව සභාවේ සභාපති වෙත යථා පරිදි කල්තබා දැන්විය යුතුය.

(8) තමාගේ ස්ථානයට සවිකර තිබෙන යම් කරාමයකින් හෝ ජල මාපක යන්ත්‍රයකින් හෝ පයිප්පයකින් හෝ වෙන උපකරණයකින් ජලය අපතේ යනබව දැනගත් කවර අවස්ථාවකදී වුව, ඒ බව වහාම සභාවේ සභාපති වෙත දැනුම්දීම පෞද්ගලික ජල සේවයක් පිහිටුවා ඇති ගෙයක හෝ ස්ථානයකම සෑම අයිතිකරුවෙකුගේම හෝ පදිංචිකරුවෙකුගේම යුතුකම විය යුතුය.

.....................................

ඉල්ලුම්කරු.

"ආ" ආකෘති පත්‍රය

19...........මස......වැනිදින,

........................................................ගම්සභා කාර්යාලයේදීය.

අංකය :————.

අටකලන්කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාවට ගෙවිය යුතු ගණන් හිලවු පිළිබඳ සටහන

| දිනය | විස්තර | රු. | ශ. |
|---|---|---|---|
| | ...........විදියේ අංක...........දරන ස්ථානයට ජලනළ දැමීම හෝ ඒ ස්ථානයෙහි ජල මාපක යන්ත්‍රය සවිකිරීමේ සම්බන්ධයෙන් දුන් උපකරන වෙනුවෙන් ................. | | |
| | ඉහත සඳහන්..............සම්බන්ධයෙන් | | |
| | කම්කරුවන් හා පරිපාලනය වෙනුවෙන් ................. | | |
| | ප්‍රධාන ජල නළයෙන් ජලය ලබාගැනීම වෙනුවෙන් අවිනිශ්චිත අවස්ථා | | |
| | මුළු ගණන | ........... | |
| | තැන්පත් කල මුදල | ........... | |
| | ගෙවිය යුතුව තිබෙන ඉතිරි මුදල | ........... | |

.....................................

සභාපති.

අටකලන්කෝරළේ මැදපත්තු
ගම්ප්‍රදේශයේ ගම් සභාව.

"ඇ" ආකෘති පත්‍රය

අටකලන්කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව

ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්යයන් සඳහා ජලමාපක යන්ත්‍රයක් මගින් ජලය සැපයීම සඳහා..................... පිහිටි .................වැනි වරිපනම් අංක දරන ස්ථානයෙහි (මෙහි මින්මතු 'අයිතිකරු' 'පදිංචිකරු' යයි හඳුන්වනු ලබන) අයිතිකරුවන ........................................එක් පාර්ශවයක් වශයෙන්ද අටකලන්කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්සභාව අනික් පාර්ශවය වශයෙන්ද ඇතුලත් වන ගිවිසුමයි.

2. ගෘහ කාර්යයන් නොවන වෙනත් කටයුතු, එනම්—

(අ) ......................................................................

(ආ) ......................................................................

(ඇ) ......................................................................

සඳහා ඉහත සඳහන් ස්ථානයට ජලය සැපයීමට ඉඩදීම සම්බන්ධයෙන් සලකා බලා මෙහි පහත සඳහන් කොන්දේසි පිළිගැනීමට අයිතිකරු *පදිංචිකරු මෙයින් එකඟ වෙයි :—

(1) අහල්...........ක ජල මාපක යන්ත්‍රයක් මගින් ජලය සැපයිය යුතුය.

(2) අයිතිකරු *පදිංචිකරු විසින්—

(අ) ජල මාපක යන්ත්‍රයක මාර්ගයෙන් ජලය සපයනු ලබන අවස්ථාවක

(I) මීටරයේ කුලිය සඳහා කාර්තුවකට හෝ ඉන් කොටසකට රුපියල් ...........ක (රු...........ශත......) මුදලක් සභාවේ සභාපති වෙත කලින් ගෙවිය යුතුය නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය.

(II) එක් එක් මාසය තුල සපයනලද වතුර ගැලුම් දහසකට රුපියල් ........... (රු. ........ශත......) බැගින් සභාවේ සභාපති වෙත ගෙවිය යුතුය. නැතහොත් ගෙවීමට සැලැස්විය යුතුය. ඉන් පළමු ගෙවීම ...........මාසයේ පළමු දින ගෙවිය යුතුය.

(ආ) ජලමාපක යන්ත්‍රයක මාර්ගයෙන් නොව වෙනත් ආකාරයකින් ජලය සපයනු ලබන අවස්ථාවක, කාර්තුවකට හෝ ඉන් කොටසකට රුපියල් ...........ක (රු. ......ශත......) මුදලක් සභාවේ සභාපති වෙත ගෙවීම හෝ ගෙවීමට සැලැස්වීම කල යුතුය.

(3) ජලමාපක යන්ත්‍රය වෙනුවෙන් ගෙවියයුතු බද්ද හෝ ජලය වෙනුවෙන් ගෙවියයුතු ගාස්තුව නියමිත දිනයේ සිට දින පහලොවක් ඇතුලතදී සභාවේ සභාපති වෙත නොගෙවූවහොත්, ජල සේවය පාවිච්චි කිරීමට ඇති අයිතිවාසිකම සභාව සතුකර ගතයුතුවාත් හැර, සභාව විසින් ජල සේවය නැවැත්විය යුතුය.

(4) ගිවිසුම අවසන්කර ගැනීමට අදහස්කරන බැව් එක් පාර්ශවයක් විසින් අනික් පාර්ශවයට තිස් දවසක දැනුම් දීමක් කිරීමෙන් කොයි පාර්ශවයකට වුවද, එය අවසන් කරගත හැකිය. එසේ ගිවිසුම අවසන් කිරීමට තීරණය කලහොත් අලුතෙන් ගිවිසුමකට බැඳෙන තුරු ඒ ස්ථානයේ අයිතිකරුට හෝ පදිංචිකරුට ජල සේවය පාවිච්චි කිරීමට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

(5) පදිංචිකරුවන් වෙනස්වීමට ආසන්න කවර අවස්ථාවකදී වුවත්, ඒ බව අයිතිකරු විසින් යථා පරිදි දැන්විය යුතුය. එසේම ඉහත සඳහන් කොන්දේසි පිළිගැනීමට කැමති බව ලියවිල්ලකින් දන්වන තුරු ඒ ජල සේවය පාවිච්චි කිරීමට කිසිම අයිතිකරුවෙකුට *පදිංචිකරුවෙකුට අයිතිවාසිකමක් නොතිබිය යුතුය.

එක්දහස් නවසිය ........... ක්වූ .............. මස ..............වැනි දින වන මෙදින ....................දී අත්සන් කරණ ලදි.

.................................

අයිතිකරු/*පදිංචිකරු.

(රුපියලක මුද්දරයක් මත අත්සන්කල යුතුය)

*අනවශ්‍ය වචන කපා හරින්න.

.................................

සභාපති,
අටකලන් කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ
ගම් සභාව.

අත්සන් සහතික කල බවට සාක්ෂිකාරයෝ :

1. .................................

2. .................................

"ඈ" ආකෘති පත්‍රය

අංකය :————

19..............මස..............වැනිදින,
අටකලන්කෝරළේ මැදපත්තු ගම් ප්‍රදේශයේ
ගම්සභා කාර්යාලයේදීය.

......................නම් විථියේ පිහිටි......................වැනි අංකය දරන ස්ථානයට......................වැනි දිනයෙන් අවසන්වන මාසය තුල සපයන ලද ජලය වෙනුවෙන් අටකලන් කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභාවට ගෙවිය යුතු ගණන් පිළිබඳ සටහනයි.

| සැඳහුම් අංකය | ජලය පිළිබඳ ගණන් | රු. | ශ. |
|---|---|---|---|
| | ජල මාපක යන්ත්‍රයෙහි වැටී තිබුන සටහන් ........... | | |
| | ගණන් ගත් දිනය ..................... | | |
| | පාවිච්චිකරන ලද ජල ගැලුම් දහකට රු. ................ | | |
| | ගණනේ...................... | ... | |
| | ගෘහ කාර්යයන් නොවන වෙනත් කාර්ය සඳහා සපයන ලද්දවූ, ජලමාපක යන්ත්‍රයෙන් නොමණින ලද්දවූ ද ජලය...................... ... | | |
| | අයවිය යුතු මුදල | | |

————————,

සභාපති.

සංලක්ෂ්‍යය ,—ඉහත සඳහන් දිනයේ සිට දින පහළොවක් ඇතුලතදී ඉහත සඳහන් මුදල.................සභාවේ කාර්යාලයට ගෙවන ලෙස මෙයින් ඔබට මම නියම කරමි.

"ඉ" ආකෘති පත්‍රය
නරක් වී තිබෙන සේවය වෙනස්කිරීම සඳහා වූ දැන්වීමයි

19............මස...............වැනි දින,
අටකලන්කෝරළේ මැදපත්තු ගම්ප්‍රදේශයේ ගම්සභා කාර්යාලයේදීය.

.............................වීථියේ පිහිටි,

.......................වැනි අංක දරණ ගෙයි අයිතිකරු හෝ පදිංචිකරු වෙතටයි.

ඉහත කී ස්ථානයට සවිකර ඇති වතුර පයිප්ප පරීක්ෂාකර බලන ලදුව, ඒවායේ යම් යම් දෝෂ තිබෙන බව පෙනීගොස් ඇති බැවින් අවශ්‍ය බවට මවිසින් මෙයින් සහතික කරනු ලබන මෙහි පහත දක්වෙන වෙනස් කිරීම් හෝ අලුත්වැඩියා කිරීම් කරගෙන යාමට පියවර ගන්නා ලෙස ඔබට නියම කරන බව මෙයින් දන්වා සිටිමි.

මේ දැන්වීම ලැබී දින...........ක් ඇතුලතදී එකී වෙනස් කිරීම් හා අලුත් වැඩියා කිරීම් මා සෑහීමකට පත්වන අයුරු කරගෙන යාමට ඔබ අපොහොසත් වුවහොත් ජල කර්මාන්තයෙන් ජල සේවා සැපයුම නතර කරනු ලබන අතර මා සෑහීමකට පත්වන පරිදි එය අලුතෙන් දමන හෝ වෙනස් කරන හෝ අලුත්වැඩියා කරන තෙක් ඒවා සභාවේ ජල කර්මාන්තයට නැවත සම්බන්ධ කරණු නොලැබේ.

————————,
සභාපති.

8—890—73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය.

---

රත්තොට සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි සහ 152 වැනි වගන්ති යටතේ රත්තොට සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ 1973 වර්ෂය සඳහා අය කරනු ලබන කසළ ශෝධන විශේෂ වරිපණම් බද්දෙන් මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් ස්ථාන නිදහස් විය යුතුයි.

උපලේඛනය

අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය

මාතලේ පාර.—5, 13, 15, 17, 19, 23, 25, 27, 29, 31, 33, 35, 37, 43/1, 49, 57, 59, 61, 69, 71, 75/10.

නිකොලොය පාර.—4, 6, 10, 12, 18, 20, 26, 28, 30, 34.

අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය

නිකොලොය පාර.—119, 123, 125, 129, 131, 139, 147, 149, 157, 44, 46, 48, 50, 52, 64, 68, 70, 74, 80, 84, 90/4, 114ඒ.

අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

නිකොලොය පාර.—55, 55/3, 57/1, 57/5, 61, 65, 67, 77, 77/2ඒ, 77/9, 85, 87, 89/1.

අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

ගම්මඩුව පාර.—3, 5, 9, 11, 25, 27/1, 27/5, 2, 4, 6, 10.
නිකොලොය පාර.—3, 19, 21, 23, 43, 45, 49.

අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

මාතලේ පාර.—4, 6, 10, 12, 16, 18, 22, 24, 28, 30, 30/6, 32/2, 32/3, 36, 38, 44, 46, 46/3, 48, 52, 54, 56, 66, 72, 80/5, 80/7, 82, 84ඒ.

අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය

ගනේතැන්න පාර.—7/12, 9, 13, 15.
මාතලේ පාර.—103/1, 109, 125, 94, 110, 118.

8–923—73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

---

රත්තොට සුළු නගර සභාව

සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි සහ 152 වැනි වගන්ති යටතේ රත්තොට සුළු නගර සභාව විසින් පනවනු ලැබ ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

ඩී. රාජේන්ද්‍ර,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ අතිරේක ලේකම්.

1973 අගෝස්තු මස 9 වැනි දින,
කොළඹ දී ය.

අතුරු ව්‍යවස්ථාව

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) වැනි වගන්තිය යටතේ 1973 වර්ෂය සඳහා අයකරනු ලබන ජලය පිළිබඳ විශේෂ වරිපණම් බද්දෙන් මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් ස්ථාන නිදහස් විය යුතුය.

උපලේඛනය

පහත සඳහන් වරිපනම් අංක දරණ ස්ථාන :—

අංක 1 දරණ ඡන්ද කොට්ඨාශය

වෙළඳපොල පාර.—22/8.

මාතලේ පාර.—7, 15, 23, 25, 27, 31, 35, 37, 43/1, 47, 57, 59, 61, 67, 71, 75, 75/10, 75/12, 85, 101.

නිකොලොය පාර.—6, 10, 12, 18, 20, 22, 30, 34.

අංක 2 දරණ ඡන්ද කොට්ඨාශය

නිකොලොය පාර.—105/9, 119, 125, 131, 141, 143, 145, 149, 153, 157, 163, 64, 66, 68, 72, 78, 80, 84, 86, 88, 88ඒ, 90, 90/4, 100, 102/4, 102/10, 106, 108, 112ඒ, 126, 130.

අංක 3 දරණ ඡන්ද කොට්ඨාශය

නිකොලොය පාර.—57, 57/5, 67, 73, 77, 77/2ඒ, 87.

අංක 4 දරණ ඡන්ද කොට්ඨාශය

ගම්මඩුව පාර.—7, 13, 15, 25, 25/1ඒ, 25/3, 25/4, 27/1, 27/5, 27/6, 31, 35/1, 41.

නිකොලොය පාර.—3, 9, 13, 15, 21, 23, 41, 47, 49, 51.

අංක 5 දරණ ඡන්ද කොට්ඨාශය

14, 18, 20, 24, 30, 30/1, 30/4, 30/6, 32/2, 32/3, 36, 40, 44, 46/3, 52, 56, 58, 60, 66, 72, 72/1, 72/2, 72/3, 80/5, 82, 84.

අංක 6 දරණ ඡන්ද කොට්ඨාශය

ගනේතැන්න පාර.—7/12, 13, 23, 23/7, 10.
ලෝන්විල් පාර.—1.

මාතලේ පාර.—101/15, 105, 109, 119, 125, 110, 116, 118, 118/2, 120, 120බී.

8–927—73. 08. 24 දින අංක 74 දරණ ගැසට් පත්‍රය

# ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන

## වැලිගම නගර සභාව

### 1972.12.31 න් අවසන් වූ වර්ෂයේ සාමාන්‍ය අංශයේ ආදායම් හා වියදම් ගිණුම

| ශීර්ෂය | විස්තර | 1972 ඇස්තමේන්තු වියදම රු. ශ. | 1972 නියම වියදම රු. ශ. | ශීර්ෂය | විස්තර | 1972 ඇස්තමේන්තු ආදායම රු. ශ. | 1972 නියම ආදායම රු. ශ. |
|---|---|---|---|---|---|---|---|
| ඒ. | සාමාන්‍ය වියදම් | 79,036 0 | 96,962 65 | ඒ. | සාමාන්‍ය ආදායම් | 2,52,051 0 | 2,28,242 12 |
| බී. | මංමාවත් | 58,625 0 | 49,548 76 | බී. | මංමාවත් | 3,663 0 | 4,451 02 |
| සී. | තානායම් සහ අම්බලම් | 6,139 0 | 8,161 53 | සී. | තානායම් සහ අම්බලම් | 21,000 0 | 11,560 31 |
| ඩී. | සභා ඉඩම් හා ගොඩනැගිලි | 20,221 0 | 16,096 15 | ඩී. | සභාවට අයත් ගොඩනැගිලි | | |
| ඊ. | මහජන සෞඛ්‍යය | 1,64,291 0 | 1,11,897 44 | | හා ඉඩම් | 11,437 0 | 11,486 35 |
| ඇෆ්. | මහජන විනෝදය | 3,871 0 | 2,288 40 | ඊ. | මහජන සෞඛ්‍යය | 38,468 0 | 30,563 85 |
| ජී. | සුසාන භූමි | 4,494 0 | 3,440 0 | එෆ්. | මහජන විනෝදය | 14,750 0 | 19,493 60 |
| එච්. | සුනඛයින් ලියාපදිංචිකිරීම | 200 0 | — | ජී. | සුසාන භූමි | 350 0 | 398 0 |
| කේ. | ගින්නෙන් ආරක්ෂාව | 200 0 | — | එච්. | සුණඛ ලේඛනය | 75 0 | 10 0 |
| එම්. | කියවීම් ශාලාව හා පුස්ත | | | එම්. | කියවීම් ශාලාව සහ පුස්ත | | |
| | කාලය | 8,928 0 | 6,950 08 | | කාලය | 1,875 0 | 774 30 |
| | අතිරික්තය ශේ/ගෙ. | — | 11,634 54 | | | | |
| | | 3,46,005 0 | 3,06,979 55 | | | 3,43,669 0 | 3,06,979 55 |

නගර සභා ආඥාපනතේ මා වෙත පැවරී ඇති බලතල අනුව 1972 වර්ෂයේ දී වැලිගම නගර සභාවේ සාමාන්‍ය අංශය වෙනුවෙන් එකතු කළ ආදායම් හා කරන ලද වියදම් දක්වෙන ඉහත සඳහන් ගිණුම වැලිගම නගර සභාවේ සභාපති මද්දුමා පටබැඳිගේ ලීලාරත්න වන මම, මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

ම. ප. ලීලාරත්න,
සභාපති, වැලිගම නගර සභාව.

නිවැරදි බවට සහතික කරමි.

එච්. ජී. ඇම්. රිචඩ් ද සිල්වා,
වැලිගම නගර සභා නියෝජිත.

වැලිගම දී මා ඉදිරිපිට දී දිවුරා අත්සන් කරන ලදී.

එච්. කේ. ප්‍රනාන්දු,
සමාදාන විනිශ්චයකාරතැන.

